නිපුණතාව 4.0 - මූලික සටහන් පොත් උපයෝගී කර ගනිමින් ගනුදෙනු ලෙජරයට පිටපත් කරයි.

නිපුණතා මට්ටම 4.8 - පාලන ගිණුම් හා උපලෙජර් අතර සම්බන්ධතාව දක්වයි.

- සමාන වර්ගයේ ගනුදෙනු රාශියක් සිදුවන ව්‍යාපාරවල ගැටළු රාශියක් මතුවන නිසා පොදු ලෙජරයට අමතරව උපලෙජර් පවත්වා ගත හැකිය.උපලෙජරය තුළ තනි සටහන් පමණක් ඇතුළත් කරයි.
  උදා-ණයගැති උපලෙජරය - ණයගැතියන්ගේ තනි තනි පුද්ගල ගිණුම් පිළියෙල කරයි.
  ණයහිමි උපලෙජරය - ණයහිමියන්ගේ තනි තනි පුද්ගල ගිණුම් පිළියෙල කරයි.

- උපලෙජරයේ ඇති ගිණුම් තුලනය කර ශේෂ ලැයිස්තුවක් පිළියෙල කරයි.පොදු ලෙජරයේ ද්විත්ව සටහන් ක්‍රමය අනුගමනය කරන අතර ණයගැතියන් හා ණයහිමියන් සම්බන්ධයෙන් පොදු ලෙජරය තුළ පාලන ගිණුම් පිළියෙල කරයි.
  උදා - ණයගැති පාලන ගිණුම,ණයහිමි පාලන ගිණුම

- පොදු ලෙජරයේ ද්විත්ව සටහන සම්පූර්ණ වීම නිසා ශේෂ පිරික්සුම පිළියෙල කරයි.නමුත්,උපලෙජරයේ ද්විත්ව සටහන සම්පූර්ණ නොවන නිසා ශේෂ පිරික්සුම පිළියෙල කළ නොහැක.
- පොදු ලෙජරයේ පාලන ගිණුමේ ශේෂය,උප ලෙජරයෙහි ශේෂ ලැයිස්තුව සමඟ සමාන විය යුතුය.එසේ ශේෂ සමාන නොවන්නේ නම් ශේෂ සැසඳීම සඳහා සැසඳුම් ලේඛනයක් සකස් කළ යුතුය.
  උදා - ණයගැති ශේෂ සැසඳීමේ ලේඛනය

<u>අභ්‍යාස</u>

1.උපලෙජරයක් පවත්වා ගැනීමේ අරමුණු මොනවාද?

2.තරුෂිගේ ව්‍යාපාරයේ 2021 ජනවාරි මාසය තුළ ණයට විකුණුම් සම්බන්ධයෙන් පහත ගනුදෙනු සිදු වී ඇත.

| ණයගැතියා | 2021/01/01 දිනට ශේෂය | විකුණුම් | ආපසු එවුම් | මුදල් ලැබීම් | දුන් වට්ටම් | බොල් ණය |
|---|---|---|---|---|---|---|
| සුපුන් | 50,000 | 100,000 | 4,000 | 57,000 | 3,000 | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| නිමේෂ් | 20,000 | 80,000 | - | 65,000 | - | 5,000 |
| වෙනුර | 5,000 | 120,000 | 2,000 | 46,000 | - | - |
| සඳරුවන් | - | 60,000 | - | 23,000 | 2,000 | - |

අවශ්‍ය වන්නේ,

1.ඉහත ගනුදෙනු සටහන් කිරීම සඳහා මූලික සටහන් පොත් පිළියෙල කරන්න.
2.පොදු ලෙජරයේ ගිණුම් පිළියෙල කර 2021/01/31 දිනට ශේෂ පිරික්සුම
3.ණයගැති උපලෙජරයේ ගිණුම් පිළියෙල කර 2021/01/31 දිනට ණයගැති ශේෂ ලේඛනයක් සකස් කරන්න.